**ශ්‍රී ලංකා ඛනිජතෙල් සංවර්ධන අධිකාරිය - 2023**

**------------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 වියාචනය කළ මතය**

ශ්‍රී ලංකා ඛනිජතෙල් සංවර්ධන අධිකාරියේ ("අධිකාරිය") 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාචනය සඳහා පදනම කොටසේ සාකච්චා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන්, මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

**1.2 වියාචනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය වියාචනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ වියාචනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ශේෂ පිරික්සුමේ දක්වා තිබූ සේවක ණය පොලිය රු. 20,632 ක්, ඩොලර් ගිණුමට අදාල බැංකු පොලිය රු. 1,780,156 ක්, ස්ථාවර තැන්පතු පොලිය රු. 3,377,325 ක් සහ ස්ථාවර තැන්පතු විනිමය අනුපාත ලාභ රු. 1,742,230 ක් සඳහා ලෙජර් ගිණුම් නඩත්තු කර නොතිබුණි. නමුත් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා භාවිතා කරන ලද ශේෂ පිරික්සුම තුල එම ශේෂ නිරූපනය විය. තවද ඉහත ශේෂවලට අදාල විස්තරාත්මක උප ලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන අතර, සේවක ණය පොලි, ඩොලර් ගිණුමට අදාල බැංකු පොලි ,ස්ථාවර තැන්පතු විනිමය අනුපාත ලාභ , ස්ථාවර තැන්පතු පොලි සහ ස්ථාවර තැන්පතු මත විනිමය ලාභ සඳහා අදාල ලෙජර් ගිණුම් පවත්වාගෙන ගොස් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කරන ලෙසට අදාල නිලධාරින්ට උපදෙස් ලබා දුනි. | සියලුම ලෙජර් ගිණුම් ඇතුළත්ව පොදු ලෙජරය පවත්නාගෙන යා යුතුය. |

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) SLPSAS 01- මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම. | | |
| (i) ප්‍රමිත අංක හි 01 හි 63 (ඇ), (ඉ) සහ 65 ඡේදයට අනුව, මූල්‍ය ප්‍රකාශනවල සෑම අංගයක්ම පැහැදිලිව හඳුනාගැනීමට සහ නිසි අවබෝධයක් ලබා ගැනීම සඳහා මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ මුදල් වර්ගය සහ මූල්‍යමය අගයන් ඉදිරිපත් කිරීමේදී භාවිතා කරන වැටයීම් මට්ටම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කල යුතු වුවත්, අධිකාරිය විසින් මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ මුදල් වර්ගය සහ මුදල් වර්ගයේ වැටයීම් අගය හෙළිදරව් කර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන අතර, මුදල් වර්ගය සහ මුදල් වර්ගයේ වැටයීම් අගයන් හෙළිදරව් කරන ලෙසට අදාල නිලධාරින්ට උපදෙස් ලබා දුනි. | කළමනාකරණය, ප්‍රමිතියේ විධි විධානවලට අනුකූල විය යුතුය. |
| (ii) ප්‍රමිතියේ 150 (අ), (ආ) ඡේදයට අනුව, ආයතනයේ පිහිටීම සහ නෛතික ස්වරූපය, ආයතනයේ ක්‍රියාකාරකම්වල ස්වභාවය සහ ප්‍රධාන ක්‍රියාකාරකම් පිළිබඳ විස්තරයක් හෙළි | අධිකාරිය මේ සමඟ එකඟ වන අතර, ප්‍රමිතියේ (ii) ඡේදයේ | කළමනාකරණය, ප්‍රමිතියේ විධි විධානවලට අනුකූල |

| | | |
|---|---|---|
| දරව් කළ යුතුය. කෙසේ වෙතත් අධිකාරිය විසින් ආයතනයේ පිහිටීම සහ නෛතික ස්වරූපය සහ ආයතනයේ මෙහෙයුම්වල ස්වභාවය සහ ප්‍රධාන ක්‍රියාකාරකම් පිළිබඳ විස්තරයක් අධිකාරිය විසින් අනාවරණය කර නොතිබුණි. | සඳහන් තොරතුරු හෙළිදරව් කරන ලෙසට අදාල නිලධාරින්ට උපදෙස් ලබා දුනි. | විය යුතුය. |
| (ආ) මූල්‍ය ප්‍රකාශන 2024 පෙබරවාරි මස 28 දින අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර තිබුණු අතර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 06 - " වාර්තා කරන දිනෙන් පසු සිදුවීම්" ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධ කිරීම සඳහා අනුමත කල දිනය මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කළ යුතුය. කෙසේ වෙතත් අධිකාරිය විසින් මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අනුමත කළ දිනය සහ එම අනුමැතිය ලබා දුන්නේ කවුරුන්ද යන්න මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන අතර, මූල්‍ය ප්‍රකාශන අනුමත කළ දිනය සහ මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීමට බලය දුන්නේ කවුරුන්ද යන්න, ඉදිරියේ දී මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ. | කළමනාකරණය, ප්‍රමිතියේ විධි විධානවලට අනුකූල විය යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 14 - සම්බන්ධිත පාර්ශවයන් පිළිබඳ හෙළිදරව් කිරීම හි 16 සහ 34 (අ),(ආ) ඡේද ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල සම්බන්ධිත පාර්ෂවයන් පිළිබඳ අදාල හෙළිදරව් කිරීම් සිදු කළ යුතුය. කෙසේ වෙතත් අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන කළමනාකරණ පිරිසගේ පහත සඳහන් පාරිශ්‍රමික පිළිබඳ අවශ්‍ය තොරතුරු මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කර නොතිබුණි. | SLPSAS – 14 ප්‍රමිතිය අනුව ප්‍රධාන කළමනාකරණ පිරිසගේ පාරිශ්‍රමික පිළිබඳ අවශ්‍ය තොරතුරු මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කරීමට අදාල නිලධාරින්ට උපදෙස් ලබා දුනි. | කළමනාකරණය, ප්‍රමිතියේ විධි විධානවලට අනුකූල විය යුතුය. |

| **සම්බන්ධිත පාර්ශවය** | **සම්බන්ධතාවය** | **ගනුදෙනුව** | **රු.** |
|---|---|---|---|
| සුරත් ඕවිටිගම මයා | සභාපති 2023.10.01– මේ දක්වා අධ්‍යක්ෂ ජනරාල් (2021.10.10–2023.09.30) | කෙටිකාලීන සේවක ප්‍රතිලාභ | 11,436,482 |
| අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් | අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් දීමනා | 230,000 |

| | | |
|---|---|---|
| (ඇ) අධිකාරිය විසින් 2023 වර්ෂය තුළ දී රු. 1,246,522 ක් විශ්‍රාමික පාරිතෝශික ලෙස ගෙවා තිබුණු අතර, ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 19 - සේවක ප්‍රතිලාභ ප්‍රමිතියෙහි 141(ඇ) (vi) ඡේදයට අනුව, ගෙවන ලද විශ්‍රාමික පාරිතෝශික පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශන තුල අදාල සටහන මගින් හෙළිදරව් කර නොතිබුණි. | SLPSAS – 19 ප්‍රමිතිය ප්‍රකාරව, විශ්‍රාමික පාරිතෝශික පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශන තුළ අදාල සටහන මගින් හෙළිදරව් කිරීමට අදාල නිලධාරින්ට උපදෙස් දෙන ලදී. | කළමනාකරණය, ප්‍රමිතියේ විධි විධානවලට අනුකූල විය යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූල්‍ය තත්ව ප්‍රකාශයේ ජංගම නොවන වත්කම් යටතේ ඛනිජ තෙල් දත්ත මිලදී ගැනීම් ලෙස රු.මිලියන 926.5 ක වටිනාකමක් දක්වා ඇති අතර මූල්‍ය ප්‍රකාශන සටහන් අංක 10 අනුව මෙම දත්ත මගින් නෝර්වේහි TGS-NOPEC Geophysical Company ASA සහ ලංකා ඛනිජ තෙල් සංස්ථාව අතර ඇති කරගත් ගිවිසුම අනුව , ඛනිජ තෙල් සමීක්ෂණ දත්ත නියෝජනය කරනු ලැබේ. මෙමගින් මීට වසර කිහිපයකට පෙර ඉහත විදේශීය සමාගම විසින් ශ්‍රී ලංකා මන්නාරම් ද්‍රෝණියේ ඛනිජ තෙල් සම්පත් ගවේෂණයේ දී ලබාගත් දත්ත මිලදී ගැනීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් ගෙවන ලද වටිනාකම නිරූපණය වේ. මෙම දත්ත ඛනිජ තෙල් සංවර්ධන අධිකාරියේ ජංගම නොවන වත්කමක් ලෙස පවත්වාගෙන යනු ලැබේ. තවද ආරක්ෂිත පියවරක් ලෙස මෙම දත්ත විදේශීය සමාගමක සුරක්ෂිතාගාරයක තැන්පත් කර ඇති අතර වාර්ෂිකව රු. 382,867 ක් ගෙවනු ලැබේ. එමනිසා මෙම දත්ත අධිකාරියේ අස්පෘශ්‍ය වත්කමක් බවට පෙනී යන අතර, 2021 සහ 2022 වර්ෂවලදී මෙම දත්ත අලෙවියෙන් අධිකාරිය විසින් රු. 223,426,889 ක ආදායමක් උපයා තිබුණු ද සමාලෝචිත වර්ෂයේ මෙම දත්ත අලෙවියෙන් කිසිදු ආදායමක් උපයා නොතිබුණි. එමනිසා මෙය අදාල වත්කමේ හානිකරණ ඇඟවීමක් බවට නිරීක්ෂණය විය. කෙසේ වෙතත් රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත - 03 ගිණුම්කරණ ප්‍රතිපත්ති , ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස් වීම් සහ වැරදි ප්‍රමිතයේ 09 සිට 15 දක්වා ඡේද ප්‍රකාරව පරිශීලකයන්ට මෙම ශේෂය අවබෝධ කර ගැනීමට හැකිවන පරිදි හඳුනා ගැනීම ,මැනීම සහ හෙළිදරව් කිරීම සඳහා සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති අධිකාරිය විසින් අනාවරණය කර නොතිබුණි. තවද, රු. මිලියන 926.5 ක් වටිනා මෙම ශේෂය සඳහා 2021 වසරේ සිට ක්‍රමක්ෂය සහ හානිකරණය අලාභයන් පිළිබඳ සමාලෝචනයක් සිදු කර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන අතර රු.මිලියන 926.5 ක වටිනා මිලදීගත් ඛනිජතෙල් දත්ත හඳුනා ගැනීම, මැනීම සහ හෙළිදරව් කිරීම සඳහා සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්තියක් සැකසීමට අදාල නිලධාරින්ට උපදෙස් ලබා දුනි. | ප්‍රමිතියට අනුව අස්පෘශ්‍ය වත්කම් සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනාවරණය කළ යුතු අතර ඒ අනුව හඳුනා ගැනීම ,මැනීම සහ හෙළිදරව් කිරීම සිදු කළ යුතුය. |

### 1.5.4 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සමාලෝචිත වර්ෂයේ විස්තීරණ ආදායම් ප්‍රකාශය අනුව, සමාලෝචිත වර්ෂයතුළ භාණ්ඩාගාරයෙන් ලැබී ඇති අක්මුදල රු. 8,600,000 ක් වූ අතර ඉන් ඉතිරි මුදල රු. 2,298,997 ක් භාණ්ඩාගාරයට ආපසු යැවිය යුතු බවට හඳුනාගෙන තිබුණි. කෙසේ වෙතත් එම ඉතිරි වටිනාකම භාණ්ඩාගාරයට යවා නොතිබුණු අතර වැඩ බලන අධ්‍යක්ෂ (මුදල්) ගේ පැහැදිලි කිරීම අනුව, එම මුදල් නැවත භාණ්ඩාගාරයට ආපසු යැවීමේ අවශ්‍යතාවයක් නොමැති බව සඳහන් කරන ලදී. එම නිසා භාණ්ඩාගාරයෙන් ලැබී ඇති අක්මුදල් රු. 8,600,000 ක් ලෙස ආදායමට හඳුනා ගත යුතු වුවද , සමාලෝචිත වර්ෂයේ ආදායම ලෙස රු. 6,301,003 ක් පමණක් හඳුනාගෙන තිබුණි. මේ අනුව | 2023 වර්ෂයේ භාණ්ඩාගාරයෙන් ලැබුණු මුලු මුදල රු. 8,600,000 ක් ලෙස හඳුනාගත යුතු බවට එකඟ වේ. එම නිසා 2023 වර්ෂයේ අවසානයේ අධිකාරියේ මුදල් ශේෂය නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | අධිකාරිය වෙත ලද සියලුම ආදායම් මූල්‍ය ප්‍රකාශන තුළ නිරූපණය කළ යුතුය. |

සමාලෝචිත වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු. 2,298,997 ක් අඩුවෙන් නිරූපණය වන බව නිරීක්ෂණය විය.

| | | |
|---|---|---|
| (ආ) අධිකාරිය නමින් පවත්වාගෙන යනු ලබන ලංකා බැංකුවේ අංක 88115198 දරන බැංකු ගිණුමෙහි 2023 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. 2,298,997ක් වුවද, එම ශේෂය මූල්‍ය තත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ සහ සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් හා මුදල් සමාන දෑ යටතේ පෙන්වා නොතිබුණි. එමනිසා සමාලෝචිත වර්ෂයේ ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | ඉහත විස්තර කර ඇති පරිදි අධිකාරියේ 2023 වර්ෂය අවසානයේ මුදල් ශේෂය රු. 2,298,997 අවසන් ගිණුම්වල ගැලපීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන තුළ සියලු මුදල් හා මුදල් සමාන දෑ නිරූපණය කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) 2021 සැප්තැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර ව්‍යවසාය සඳහා වූ මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.4 මාර්ගෝපදේශය. | වාර්ෂිකව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඇමුණුම II හි දක්වා ඇති ආකෘතිය භාවිතා කරමින් අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් වෙත ඔවුන්ගේ සම්බන්ධතාවය තනි තනිව ප්‍රකාශ කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ දී අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ කිසිදු සාමාජිකයෙකු මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන අතර, 2021 සැප්තැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර සඳහා වන යහපාලන මාර්ගෝපදේශයේ ඡේද අංක 2.4 අනුව ඉදිරියේදී වාර්ෂිකව එම ප්‍රකාශ ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. | මාර්ගෝපදේශ අනුව වාර්ෂිකව අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින්ගෙන් සම්බන්ධතා පිළිබඳ ප්‍රකාශ ලබා ගත යුතුය. |
| (ආ) 2021 අංක 21 දරන ඛනිජතෙල් සම්පත් සංවර්ධන පනත. | | | |
| (i) 2021 අංක 21 දරන ඛනිජතෙල් සම්පත් සංවර්ධන පනතේ අංක 2(අ) වගන්තිය. | ශ්‍රී ලංකාවේ සියළු ඛනිජතෙල් සම්පත් ගවේෂණය, සංවර්ධනය, නිෂ්පාදනට සහ කළමනාකරණය ආවරණය කරමින් උද්ගාමී ඛනිජතෙල් කර්මාන්තය සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම පිළිබඳ උපදෙස් ලබා දීම පිණිස ප්‍රතිපත්ති උපදේශක කමිටුවක් පිහිටුවීම අධිකාරියේ එක් අරමුණක් වුවත්, 2024 ඔක්තෝබර් වන විටත් අධිකාරිය විසින් එවැනි උපදේශක කමිටුවක් පිහිටුවා නොතිබුණි. | උද්ගාමී ඛනිජතෙල් කර්මාන්තය සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමට අවශ්‍ය බව අධිකාරිය විසින් පිළිගනු ලබයි. අමාත්‍යාංශයේ සහය ඇතිව ප්‍රතිපත්ති උපදේශක කමිටුවක් කඩිනමින් පිහිටුවීමට අපේක්ෂා කරනු ලබන අතර උද්ගාමී ඛණිජතෙල් කර්මාන්තය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති උපදේශන කමිටුවට අධිකාරියේ නිර්දේශ ලබා දීමට කටයුතු කරනු ලැබේ. | උද්ගාමී ඛනිජතෙල් කර්මාන්තය සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම කඩිනම් කිරීම සඳහා ප්‍රතිපත්ති උපදේශක කමිටුවක් පිහිටුවීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | 2021 අංක 21 දරන ඛනිජතෙල් සම්පත් සංවර්ධන පනතේ අංක 3(3)(අ) සහ 3(3) (ඇ) වගන්ති. | ශ්‍රී ලංකාවේ උද්ගාමී ඛනිජතෙල් කර්මාන්තය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති උපදේශක කමිටුව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සහ පනතේ විධිවිධාන සලස්වා ඇති ආකාරයෙන් ශ්‍රී ලංකාවේ උද්ගාමී ඛනිජතෙල් කර්මාන්තය සම්බන්ධ සියලු නියාමන කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා අධිකාරිය වගකිව යුතු වුවත්, ඒ සම්බන්ධව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | උද්ගාමී ඛනිජතෙල් කර්මාන්තය සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමට අවශ්‍ය බව අධිකාරිය විසින් පිළිගනු ලබන අතර, අමාත්‍යාංශයේ සහය ඇතිව ප්‍රතිපත්ති උපදේශක කමිටුවක් කඩිනමින් පිහිටුවීමට අපේක්ෂා කරනු ලැබේ. | -එම- |
| (iii) | 2021 අංක 21 දරන ඛනිජතෙල් සම්පත් සංවර්ධන පනතේ අංක 4(ආ) වගන්තිය. | සීමාංකනය කර සහ නම් කර ඇති බිම් කොටස්වල ආයෝජනය සඳහා පවතින බිම් ප්‍රමාණය අලෙවි ප්‍රවර්ධනය කිරීම අධිකාරියේ කාර්යයක් වුවත්, අනුමත රෙගුලාසි නොමැති වීම හේතුවෙන් පවතින බිම් කොටස් 922 ක් ප්‍රවර්ධනය සහ අලෙවි කිරීමට අධිකාරියට නොහැකි වී තිබුණි. | 2023 ජනවාරි 05 වන දින පහත සඳහන් රෙගුලාසි, ගැසට් කරන ලදී.<br><br>i. ඛනිජතෙල් සම්පත් (ඒකාබද්ධ අධ්‍යයන ගිවිසුම්) රෙගුලාසි අංක 01/2023<br><br>ii. ඛනිජතෙල් සම්පත් (සේවා සැපයුම් බලපත්‍ර) රෙගුලාසි අංක 02/2023<br><br>ගැසට් කරන ලද රෙගුලාසිවලට ඒකාබද්ධ අධ්‍යන සඳහා අභිලාෂ කැඳවීමට 2023 ජුලි 19 වන දිනැති අමප/ 23/1338/621/056 කැබිනට් තීරණය යටතේ අනුමැතිය ලද නමුත් උක්ත රෙගුලාසිවල යම් නීතිමය සහ අනෙකුත් ගැටළු නිරීක්ෂණය වූ හෙයින්, 2023 වර්ෂය පුරාවට මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සහය ඇතිව බ්ලොක් සිතියම සකස් කිරීම සහ JSA රෙගුලාසි සංශෝධනය කිරීමට අවධානය යොමු කරන ලදී. | හඳුනාගත් ගැටළු නිරාකරණය කර පවතින බිම් කොටස් 922 ප්‍රවර්ධනය සහ අලෙවි කිරීම කඩිනම් කිරීම සඳහා කටයුතු කළ යුතුය. |
| (iv) | 2021 අංක 21 දරන ඛනිජතෙල් සම්පත් සංවර්ධන පනතේ අංක 4(ඊ) වගන්තිය. | ඛනිජතෙල් මෙහෙයුම් නියාමනය කිරීම සඳහා අවශ්‍ය විය හැකි යම් විධාන හා මාර්ගෝපදේශ නිකුත් කිරීමට අධිකාරියට බලය තිබුණ ද ඛනිජතෙල් මෙහෙයුම් නියාමනය කිරීම සඳහා අවශ්‍ය රෙගුලාසි නිකුත් කර නොතිබුණි. | - එම - | ඛනිජතෙල් මෙහෙයුම් නියාමනය කිරීම සඳහා උපදෙස් සහ මාර්ගෝපදේශ සකස් කර නිකුත් කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය ආදායම ඉක්මවූ වියදම රු. 116,970,816 ක් වූ අතර ඉකුත් වර්ෂයේ ආදායමට වඩා අනුරූප වියදම රු. 11,626,790 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 105,344,026 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු ප්‍රතිපාදන රු. 65,246,539 ක් අඩුවීම, පෙර වර්ෂයේ විදේශ විනිමය ලාභය රු.16,192,355 හා සසඳන විට සමාලෝචිත වර්ෂයේ විදේශ විනිමය පාඩුව රු. 22,435,568 ක් වීම සහ පෙර වසරට සාපේක්ෂව මූල්‍ය හා අනෙකුත් වියදම් රු. 10,826,775 ක් වැඩිවීම හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්, ඉකුත් වර්ෂය සමඟ සසඳා වැඩිවීම් හෝ අඩුවීම්වල ප්‍රතිශතයන් සමඟ පහත පරිදි විශ්ලේෂණය කරන ලදී.

| විස්තරය | 2023<br>රු. 000' | 2022<br>රු. 000' | වෙනස<br>රු. 000' | ප්‍රතිශතය<br>% |
|---|---|---|---|---|
| ආදායම | 6,301 | 73,846 | (67,545) | (91) |
| අනෙකුත් ආදායම් | 6,920 | 1,048 | 5,872 | 560 |
| විදේශ විනිමය ලාභය/ (අලාභය) | (22,435) | 16,192 | (38,627) | (239) |
| පරිපාලන සහ ආයතනික වියදම් | 96,916 | 93,918 | 2,998 | 3 |
| පර්යේෂණ සහ සංවර්ධන වියදම් | - | 8,783 | (8,783) | (100) |
| මූල්‍ය සහ වෙනත් වියදම් | 10,840 | 13 | 10,827 | 83,285 |
| වියදම ඉක්මවූ ආදායම | (116,971) | (11,627) | (105,344) | 906 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අධිකාරිය මෙහෙයුම් කටයුතු සඳහා 2021 ඔක්තෝබර් මාසයේ සිට සෙලින්කෝ ගොඩනැගිල්ලේ මුළු වර්ග අඩි 8512 ක් කුලියට ගෙන තිබූ අතර, වර්ග අඩියකට රු. 245 ක් බැගින් , සමාලෝචිත වර්ෂය සඳහා කුලී වියදම් ලෙස රු. 28,937,103 ක් භාණ්ඩාගාර ප්‍රතිපාදන වලින් ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ නිලධාරීන් 11 ක් පමණක් සේවයේ යොදවා ඇති අතර, 2024 සැප්තැම්බර් වන විට නිලධාරීන් 10 ක් පමණක් සේවයේ යොදවා ඇති බව නිරීක්ෂණය විය. එමනිසා විශාල ඉඩකඩ ප්‍රමාණයක් නිෂ්කාර්යව පැවති බව විගණනයේ දී නිරීක්ෂණය විය. කුලී ගිවිසුම 2023 ජූලි 20 දිනෙන් අවසන්වී තිබූ අතර අධිකාරිය තරගකාරී ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය නොකර වසරින් වසර ගිවිසුම | සෙලින්කෝ ගොඩනැගිල්ල, ඛනිජතෙල් සංවර්ධන අධිකාරිය සඳහා කුලී පදනම මත ලබාගෙන ඇත්තේ ඛනිජතෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය පැවති අවධියේ සිටය. මෙම ගොඩනැගිලි පරිශ්‍රයේ අධිකාරියේ සේවකයන් 36 ක කාර්යමණ්ඩලයක් හා පුහුණු වන්නන් 5-6 ක් පමණ සේවයේ යෙදී සිට ඇති අතර මෙම කුලී ගිවිසුම 2023 ජූලි මස අවසන් වී තිබුණි. අධිකාරිය සඳහා සුදුසු ස්ථානයක් තෝරා ගැනීම සඳහා තරගකාරී ලංසු කැඳවීමේ ක්‍රියාවලිය අනුගමනය කරන ලදී. කෙසේ වෙතත් ප්‍රතිචාර දක්වන ලංසු කරුවන් ඇ.ඩො. වලින් ලංසු ඉදිරිපත් කර තිබූ අතර , ප්‍රතිචාර දැක්වූ ලංසුකරු විසින් විශාල මුදලක් ඇ.ඩො. වලින් රැඳවුම් මුදල් ලෙස තැන්පත් කිරීමට කොන්දේසියක් | අධිකාරිය විසින් ගොඩනැගිලි කුලී පදනම මත ලබා ගැනීමේ දී, ප්‍රසම්පාදන කටයුතු තරඟකාරී සහ ආර්ථිකමය වශයෙන් සිදු කළ යුතුය. |

| | | |
|---|---|---|
| දීර්ස කර තිබුණි. | පනවා තිබුණි. තවද , එකල පැවති විනිමය අනුපාත සැලකිය යුතු ලෙස උච්චාවචනය විය. ප්‍රසම්පාදන කමිටුව විසින් තෝරාගත් ලංසුකරුගේ තීරණ අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කලද, භාණ්ඩාගාර නියෝජිතයා මෙම තීරණයට විරුද්ධ වීම නිසා එම ක්‍රියාවලිය නතර විය. එබැවින් 2024/2025 සඳහා සෙලින්කෝ ගොඩනැගිල්ල සමඟ පවතින ගිවිසුම දීර්ස කරන ලදී. | |
| (ආ) 2017 වර්ෂයේ සිට ජාතික රක්ෂණ භාර අරමුදල මගින් අර්ධ රාජ්‍ය අංශයේ සේවකයන් සඳහා එක් අයෙකුට මසකට රු. 1,000 ක දායකත්වයක් අය කරමින් ස්වයං දායක රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දී තිබුණ ද, අධිකාරිය විසින් සේවකයන් සඳහා ස්වයං දායක රක්ෂණ ක්‍රමයක් වෙනුවට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව, 2023 වර්ෂය සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලබා දුන් මුදලින් එක් අයෙකුට රු. 189,014 ක් බැගින් රක්ෂණ වාරික සඳහා රු. 2,079,158 (2022-රු. 1,193,479) ක් ගෙවා තිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන අතර සේවකයන් සඳහා සුදුසු වෛද්‍ය රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගනු ලැබේ. | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව රක්ෂණාවරණය ලබා ගැනීම සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු අතර , අධිකාරියට වඩාත්ම ලාභදායී ස්වයං දායක රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දීමට කඩිනමින් පියවර ගත යුතුය. |

## 3.2 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරිය වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මට අනුව රු.මිලියන 45 ක් වටිනා ප්‍රධාන ප්‍රසම්පාදන කටයුතු 06 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණ ද සමාලෝචිත වර්ෂය තුළ කිසිදු ප්‍රසම්පාදන ක්‍රියාකාරකමක් ක්‍රියාත්මක කර නොතිබුණි. | • අනුමත ප්‍රසම්පාදන සැලැස්මේ බොහෝ ක්‍රියාකාරකම් ඒකාබද්ධ අධ්‍යයන (JS) ගිවිසුම් ප්‍රකාශ කිරීමේ ප්‍රගතිය හා සුදුසුකම් ලත් ආයෝජකයින් සමඟ JS ගිවිසුම්වලට එළඹීමේ ප්‍රගතියට සමගාමීව ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලදී. කෙසේ වෙතත් ,2023 දී ඒකාබද්ධ අධ්‍යයන (JS) රෙගුලාසි ප්‍රකාශයට පත් කිරීමෙන් පසු ඇති වූ නීතිමය දෝෂ සහ වෙනත් ගැටළු හේතුවෙන් , JS වැඩසටහන් ප්‍රකාශයට පත් කිරීම අඛණ්ඩ ප්‍රමාදයකට ලක් විය. ඒ අනුව ඉදිරියේ දී JS ක්‍රියාකාරකම්වල ප්‍රගතිය මත ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුළත් කරුණුවලට අදාල කාර්යයන් පුළුල් ලෙස ක්‍රියාත්මක කරනු ලැබේ.<br><br>• රජයේ නිලධාරීන්ට විදේශ සංචාර සඳහා සීමා පැනවීමට තීරණය කිරීම හේතුවෙන් අධිකාරියේ තාක්ෂණික නිලධාරීන්ට සමහර ජාත්‍යන්තර | අධිකාරිය විසින් ක්‍රියාත්මක කිරීමට තහවුරු කර ගත් ක්‍රියාකාරකම් ඉදිරි වසරේ ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කළ යුතුය. |

| | | |
|---|---|---|
| | සමුළුවලට සහභාගී වීමට අවසර නොලැබුණු අතර ඒ හේතුවෙන් ප්‍රසම්පාදන සැලැස්මේ අංක 07 යටතේ සැලසුම් කර ඇති ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.<br><br>• ප්‍රසම්පාදන සැලැස්මේ 2 වන කරුණට අනුව, අධිකාරිය විසින් කුඩා ඉඩකඩක් සහිත සුදුසු කාර්යාල ස්ථානයක් තෝරා ගැනීම සඳහා ලංසු කැඳවා ඇගයීමට ලක් කරන ලදී. කෙසේ වෙතත් විචලා අනුපාත ඇතුළත්ව ඇ.ඩො. වලට පරිවර්තනය කර කුලී ගෙවීමේ කොන්දේසි හේතුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලය මෙම ක්‍රියාවලිය අනුගමනය නොකරන ලදී. | |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දින වන විට අධිකාරියේ අනුමත සේවක සංඛ්‍යාව 33 ක් වූ අතර, සත්‍ය කාර්යමණ්ඩලය 10 ක් විය. 2024 සැප්තැම්බර් වන විට අධිකාරියේ තනතුරු 23 ක් සඳහා පුරප්පාඩු පැවතුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ 13.3 වගන්තිය ප්‍රකාරව වැඩ බැලීමේ පත් කිරීමක් කළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් පමණක් වුවද, තනතුරට පූර්ණ කාලීන නිලධරයෙකුගේ සේවය අවශ්‍ය නම් නිත්‍ය පත් කිරීම නොපමාව කළයුතු ය. කෙසේ වෙතත්, 2022 වසරේ දී ස්ථිර තනතුරු 02 ක් සහ 2023 වසරේ දී ස්ථිර තනතුරු 02 ක් තාවකාලික පදනමින් පුරවා තිබුණි. | අධිකාරිය විසින් දේශීය හා ජාත්‍යන්තර වශයෙන් මීතේන් අඩු කිරීම, කාබන් ග්‍රහණය කර ගැනීම සහ වෙන් කිරීම සහ හයිඩ්‍රජන් තාක්ෂණය පිළිබඳව තම කාර්යමණ්ඩලට සහ අනෙකුත් රාජ්‍ය ආයතන සඳහා දේශීය හා ජාත්‍යන්තර පුහුණු වැඩමුළු සඳහා පහසුකම් සපයන ලදී. Deloitte සහ ICF විසින් මෙහෙයවනු ලබන මෙම පුහුණු වැඩසටහන් සඳහා ශ්‍රී ලංකා රජයට කිසිදු වියදමක් නොතිබුණු අතර, ඒ සඳහා අරමුදල් සපයනු ලැබුවේ එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ බලශක්ති සම්පත් කාර්යාංශය සහ එක්සත් ජනපද අභ්‍යන්තර කටයුතු දෙපාර්තමේන්තුව විසින්ය. කෙසේ වෙතත්, විදේශ සංචාර සීමා කිරීම් සහ කාර්ය මණ්ඩලය නොමැතිවීම වීම හේතුවෙන් සැලසුම් කළ රජයේ අරමුදල් වැඩසටහන් ක්‍රියාත්මක නොවිණි. | අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධිකාරියේ අවශ්‍යතාවයට ගැලපෙන ප්‍රසස්ථ කාර්යමණ්ඩලය තීරණය කර අනුමත කරගත යුතුය. |

### 3.4 වාහන සංචිතය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු. 16,500,000 ක් වටිනා වාහන දෙකක් දීර්ඝ කාලයක් භාවිතා කර නොතිබුණු අතර විගණිත දිනය වන විටත් මෙම වාහන දෙක අක්‍රීයව පැවතුණි. | අංක WP-KU-8959 දරන වාහනය අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නිල වාහනය ලෙස වෙන් කර තිබූ අතර, එම තනතුර දැනට පුරප්පාඩු වී පවතින බැවින් වාහනය කාලාතුරකින් භාවිතා කරනු ලැබේ. මීයන් විසින් සිදු කර ඇති හානිය අලුත්වැඩියා කිරීමට නිලධාරීන්ට උපදෙස් දෙන ලදී.<br><br>මෙවන විට අධිකාරියේ එක් රියදුරෙකු පමණක් සේවය කරන බැවින් වාහන 04 ක් නඩත්තු කිරීම දුෂ්කර වී ඇත. WP-PB-7708 වාහනයේ බැටරිය අලුත්වැඩියා කිරීමෙන් පසු නැවත භාවිතා කළ හැකිය. | වාහනවල ආරක්ෂාව, නඩත්තුව සහ භාවිතය කාර්යක්ෂමව සහ ඵලදායීව සිදු කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගත යුතුය. |